# ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ගැසට් පත්‍රය

## අති විශෙෂ

අංක 1783/39 - 2012 නොවැම්බර් මස 09 වැනි සිකුරාදා - 2012.11.09

(රජයේ බලයපිට ප්‍රසිද්ධ කරන ලදී)


# IV (අ) වැනි කොටස - පළාත් සභා

## පළාත් සභා නිවේදන

**1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කියවිය යුතු 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 154 වන වගන්තිය යටතේ පළ කරනු ලබන නිවේදනය**

255 අධිකාරිය වන නගර සභා ආඥාපනතේ 157(14අ) උප වගන්තිය සමග කිය විය යුතු එකී පනතේ 153 වන වගන්තියෙන් පානදුර නගර සභාව වෙත පැවරී ඇති බලතල ප්‍රකාර එකී නගර සභාව විසින් සාදනු ලැබ, මෙහි පහත දැක්වෙන අතුරු ව්‍යවස්ථාව, 2011.11.29 වැනි දින පැවති මාසික සභා රැස්වීමේ අංක 4.1 දරන යෝජනාවෙන් සම්මතය ලබා ඇත. 1989 අංක 12 දරන පළාත් සභා (ආනුශංගික විධිවිධාන) පනතේ 2 වැනි වගන්තිය සමග කිය විය යුතු ඉහත කී, 255 අධිකාරිය වන නගර සභා ආඥා පනතේ 154 වන වගන්තිය ප්‍රකාර එකී අතුරු ව්‍යවස්ථාව බස්නාහිර පළාතේ, පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය හා මුදල් හා ක්‍රමසම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ වෙළෙඳ අමාත්‍ය ප්‍රසන්න රණතුංග වන මා විසින් අනුමත කරන ලද බව මෙයින් නිවේදනය කරනු ලැබේ.

ප්‍රසන්න රණතුංග,
බස්නාහිර පළාතේ පළාත් සභාවේ ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන,
නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන,
විදුලිබල හා බලශක්ති, මිනිස්බල හා රැකීරක්ෂා,
ආර්ථික ප්‍රවර්ධන සහ වෙළෙඳ අමාත්‍ය.

2012 නොවැම්බර් මස 07 වැනි දින,
කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරයේ පිහිටි,
බස්නාහිර පළාත් ප්‍රධාන අමාත්‍ය කාර්යාලයේ දී ය.

පානදුර නගර සභාව

**ත්‍රීරෝද රථ නැවතීම පිළිබඳ අතුරු ව්‍යවස්ථාව**

1. මේ අතුරු ව්‍යවස්ථා පානදුර නගර සභාවේ ත්‍රීරෝද රථ නවතා තැබීම පිළිබඳ අතුරු ව්‍යවස්ථා යනුවෙන් හඳුන්වනු ලැබේ.

2. මේ අතුරු ව්‍යවස්ථා සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබීම, විධිමත් කිරීම, පාලනය කිරීම හා නවතා තැබීමේ ස්ථාන සඳහා ගාස්තු අයකිරීම සඳහා පනවනු ලැබේ.

3. (1) සභා බල ප්‍රදේශය තුළ ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන සහ එකී එක් එක් ස්ථානයේ නවතා තැබිය යුතු උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව සභාවේ යෝජනා සම්මුතියක් මගින් නිශ්චය කළ යුතු අතර, එම තීරණ ගැසට් පත්‍රයේ පළ කරනු ලබන දිනයේ සිට හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනක හෝ සිට ක්‍රියාත්මක වන්නේ ය.

1A - PG 001434 — 380 (2012/11)

(2) ඉහත 3(1) ව්‍යවස්ථාව අනුව නිශ්චය කළ ත්‍රීරෝද රථ නවතා තබන ස්ථාන හා සංඛ්‍යාව සංශෝධනය කළ යුතු යැයි සභාවට හැඟී යන්නේ නම්, සභා සම්මුතියක් මගින් එසේ කළ හැකි අතර, එය *ගැසට් පත්‍රයේ* පළකළ දිනක සිට හෝ එහි සඳහන් නිශ්චිත දිනයක සිට ක්‍රියාත්මක වන්නේ ය.

(3) ත්‍රීරෝද රථ නැවතුම්පොළ ස්ථාන නිශ්චය කිරීම, එහි පරාසයන් තීරණය කිරීම හා නතර කළ හැකි උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව තීරණය කිරීම සඳහා හෝ එම තීරණ සංශෝධනය පළමුවන උප ලේඛනයේ සඳහන් අයගෙන් සමන්විත කමිටුවක නිර්දේශ සභාව විසින් ලබා ගත යුතු ය.

(4) 3 (1) ව්‍යවස්ථාව අනුව ත්‍රීරෝද රථ නවතා තැබිය යුතු ස්ථාන හඳුනා ගැනීම පිණිස වන පුවරුවක් සෑම නැවතුම් පොළක ඉදිරිපිට සවිකළ යුතු වන අතර, එම පුවරුවේ අදාළ නැවතුම් පොළේ සංකේත අංකය ප්‍රදර්ශනය කළ යුතු ය.

3 (2) ව්‍යවස්ථාව අනුව නැවතුම්පළක නවතා තැබිය හැකි උපරිම ත්‍රීරෝද රථ සංඛ්‍යාව අදාළ පුවරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

(5) නැවතුම්පොළෙහි ත්‍රීරෝද රථ ක්‍රමානුකූලව නවතා තැබිය යුතු අතර, නවතා තැබිය යුතු ආකාරය සභාවේ බලයලත් නිලධාරියකු විසින් පළල අඟල් 04 ක් වූ සුදු හෝ කහ පැහැති රේඛාවක් මගින් සළකුණු කර තිබිය යුතු ය.

4. නගර සභාව විසින් ත්‍රීරෝද රථ නවතා තැබීම පිණිස මෙම අතුරු ව්‍යවස්ථාවේ දෙවැනි උපලේඛනයේ සඳහන් ආකාරයේ බලපත්‍රයක් සභාපතිවරයා විසින් නිකුත් කිරීම හා ඒ සඳහා ගාස්තු පනවා අය කිරීම නීත්‍යානුකූල වන්නේ ය.

5. ත්‍රීරෝද රථ නැවතුම්පොළක නවතා තබන ත්‍රීරෝද රථ බලපත්‍ර ලබාදීමේ දී නැවතුම්පොළට ආසන්නතම පදිංචිකරුවන්ට අයත් ත්‍රීරෝද රථවලට ප්‍රමුඛත්වය ලබා දිය යුතු ය.

6. (1) තුන්වන උපලේඛනයේ සඳහන් ආදර්ශ අයදුම්පත පරිදි තම ස්ථිර පදිංචියට ආසන්නතම ත්‍රීරෝද රථ නැවතුම්පොළහි නවතා තැබීම සඳහා නගර සභාවෙන් බලපත්‍රයක් ඉල්ලුම් කළ යුතු අතර, ඒ සඳහා අයදුම්පත්‍රය රු.50ක මුදලක් ගෙවා සභාවෙන් ලබා ගත යුතු ය. මෙම අයදුම්පත්‍ර ගාස්තුව සභාව විසින් ගනු ලබන තීරණ අනුව කලින් කලට සංශෝධනය කළ හැකිවේ.

(2) ත්‍රීරෝද රථ පදවන්නා අයිතිකරු නම්, ඔහුගේද, පදවන්නා කුලී රියදුරෙකු නම් ඔහුගේ සහ අයිතිකරුගේද පහත සඳහන් ලේඛනවල ඡායාස්ථ පිටපත් අයදුම්පත සමග ඉදිරිපත් කළ යුතු ය. එම අයදුම්පත තුන්වන උපලේඛනයේ සඳහන් පරිදි විය යුතු ය :–

(i) ත්‍රීරෝද රථ හිමිකරුගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය ;
(ii) ත්‍රීරෝද රථයේ ලියාපදිංචි සහතිකය ;
(iii) කුලී රියදුරාගේ ජාතික හැඳුනුම්පත හා වලංගු රියදුරු බලපත්‍රය.

(3) සභාවේ බලපත්‍ර ලත් ත්‍රීරෝද රථ සම්බන්ධ ලේඛනයක් පවත්වාගෙන යා යුතු අතර, බලපත්‍රය අවලංගු කරනු ලැබූ විට ඒ බව සටහන් කර රතු තීන්තෙන් සලකුණු කළ යුතු ය.

(4) සභාව විසින් මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව හෝ ත්‍රීරෝද රථ නවතා තැබීම සඳහා බලපත්‍ර ලබාදිය හැක.

(5) වලංගු බලපත්‍රයේ ඡායා පිටපතක් පැහැදිලිව පිටතට පෙනෙන සේ ත්‍රීරෝද රථයේ ඉදිරි පස වීදුරුවේ ප්‍රදර්ශනය කළ යුතු ය.

(6) ත්‍රීරෝද රථයේ දකුණු පසින් මගීන්ට නැගීම හෝ බැසීම කළ නොහැකි වනසේ අහුරා තිබිය යුතු ය.

(7) බලපත්‍රය ත්‍රීරෝද රථයෙහි ලියාපදිංචි හිමිකරු නමට නිකුත් කළ යුතු ය.

(8) බලපත්‍රයේ වලංගු කාල සීමාව අවසන්වීමට සති දෙකකට පෙර බලපත්‍රය අළුත් කරවා ගැනීම ත්‍රීරෝද රථ අයිතිකරු විසින් කළ යුතු ය.

(9) ඉහත 6(4) අනුජේදයේ මාසිකව හෝ ත්‍රෛමාසිකව හෝ වාර්ෂිකව හෝ පනවා අය කළ යුතු බලපත්‍ර ගාස්තුව සභාව විසින් තීරණය කළ යුතු අතර, එම තීරණ *ගැසට් පත්‍රයේ* පළ කරනු ලබන දිනයක හෝ එහි සඳහන් කරනු ලබන නිශ්චිත දිනයක සිට ක්‍රියාත්මක වන පරිදි අය කළ යුතු ය.

(10) 4 වැනි අතුරු ව්‍යවස්ථාව අනුව සභාව විසින් නිකුත් කරන ලද වලංගු බලපත්‍රයක් ඇත්තේ නම් මිස, ත්‍රීරෝද රථ නැවතුම්පොළකට ත්‍රීරෝද රථයක් ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතු ය.

(11) නිකුත් කළ වලංගු බලපත්‍රයක් ඇත්තේ වුවද පොලිස් නිලධාරියකු විසින් හෝ සභාපතිවරයා හෝ ඔහු විසින් බලය දෙනු ලැබූ නිලධාරියකු විසින් තාවකාලිකව ත්‍රීරෝද රථ නැවතුම්පොළෙන් ත්‍රීරෝද රථ ඉවත් කිරීමට විධාන කළ හැකි අතර, මෙම බලපත්‍රය ඊට බාධාවක් නොවිය යුතු ය.

7. නැවතුම් පොළක වෙනත් වාහන ඇතුළු කිරීම හෝ නවතා තැබීම නොකළ යුතු ය.

8. නැවතුම් පොළට ඇතුළුවන ස්ථානයට හෝ ඉන් පිටවන ස්ථානයට බාධාවන අයුරින් ත්‍රීරෝද රථ හෝ වෙනත් වාහන හෝ නවතා තැබීම නොකළ යුතු ය.

9. නැවතුම් පොළක ත්‍රිරෝද රථය ඉවත් කර ගැනීමේ කාර්යයට අදාළ යම් අළුත්වැඩියාවක් මිස, නැවතුම් පොළ ඇතුළත වෙනත් කිසිදු ආකාරයක අළුත්වැඩියාවක් කිරීම නොකළ යුතු ය.

10. යම් ත්‍රිරෝද රථයක් නතර කර තැබීම සඳහා බලපත්‍රයක් ලබාගෙන ඇත්තේ යම් නැවතුම් පොළකට ද එම බලපත්‍රය අදාළ වන නැවතුම්පොළෙහි හැර වෙනත් කවර හෝ ස්ථානයක කුලී ගමනක් අපේක්ෂාවෙන් ත්‍රිරෝද රථයක් නවතා තැබීම නොකළ යුතු ය.

11. ත්‍රිරෝද රථ නැවැත්වීම සම්බන්ධයෙන් වන මේ අතුරු ව්‍යවස්ථා සතියේ සෑම දිනකම 06.00 පැය සිට 20.00 පැය දක්වා බලාත්මකව පැවතිය යුතු යි.

(1) ඉහත 11 වැනි අතුරු ව්‍යවස්ථාවේ සඳහන් වේලාවන් සභාවේ අවශ්‍යතාවය මත සහා යෝජනා සම්මුතියකින් සංශෝධනය කළ හැකි අතර, එය ගැසට් පත්‍රයේ පළ කරනු ලබන නිවේදනයක් මගින් ප්‍රකාශයට පත් කිරීමෙන් පසුව ක්‍රියාත්මක විය යුතු ය.

12. බලපත්‍රය හිමි ත්‍රිරෝද රථ නැවතුම් පොළක නතර කර ඇති අවස්ථාවේ දී සේවයේ යෙදී සිටින රියදුරන්, පිටස්තර පුද්ගලයන් ත්‍රිරෝද රථ නැවතුම් පොළට කැඳවා, නිකරුනේ ගැවසීමට ඉඩදීම නොකළ යුතු ය.

13. නැවතුම් පොළක, කවර හෝ තැනැත්තකු විසින් මත්ද්‍රව්‍ය භාවිතා කිරීම හෝ දුරාචාරයේ හැසිරීම හෝ වෙනත් කිසිදු පීඩාකාරී ක්‍රියාවක් හෝ නොකළ යුතු අතර, එවැනි ක්‍රියා කිරීම සඳහා ඉඩ නොදීමට නැවතුම්පොළ භාවිතා කිරීමට අවසර ලද පුද්ගලයන්ගේ වගකීමක් වේ.

14. බලපත්‍රයක් හිමි කවර හෝ තැනැත්තකු විසින් නැවතුම්පොළක විෂමාචාර ක්‍රියාවක නිරත වූ බවට ජනතාවගෙන් පැමිණිල්ලක් ලද අවස්ථාවක, ඒබව පරීක්ෂණයක් පවත්වා සනාථ වුවහොත් ඔහුගේ බලපත්‍රය අහෝසි කිරීමේ බලය සභාව සතුවේ.

15. සභාපතිවරයා හෝ ඔහු විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ නිලධාරියකු හෝ පොලිස් නිලධාරියකු හෝ ඉල්ලා සිටි ඕනෑම විටක වලංගු බලපත්‍රයේ මුල් පිටපත ත්‍රිරෝද රථයේ රියදුරු හෝ අයිතිකරු විසින් ඉදිරිපත් කළ යුතුයි.

16. මේ අතුරු ව්‍යවස්ථාවල කවර හෝ විධිවිධානයක් උල්ලංඝණය කිරීම වරදක් වන අතර, එකී වරද සම්බන්ධයෙන් නිසි බලය ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු, රුපියල් හත්සිය පනහක් නොඉක්මවන දඩයකට යටත් කළ හැකි ය. එකී උල්ලංඝණය කිරීමේ වරද දිගින් දිගටම කර ගෙන යන අවස්ථාවක, නිසි අධිකරණ බලයක් ඇති අධිකරණයක් විසින් වරදකරු කිරීමෙන් පසු හෝ එකී උල්ලංඝණය කිරීමේ වරද කෙරෙහි අවධානය යොමු කරන ලිඛිත දැන්වීමක් සභාපති විසින් හෝ තත් කාර්යය සඳහා ඔහුගෙන් බලයලත් නිලධාරියකු හෝ භාර කරනු ලැබීමෙන් පසු හෝ එකී වරද තවදුරටත් කරගෙන යනු ලබන සෑම දිනක් සඳහාම රුපියල් දෙසිය පනහක් නොඉක්මවන අතිරේක දඩයකින් දඬුවම් කරනු ලැබීමට යටත් වන්නේ ය.

17. මෙම ව්‍යවස්ථාවේ පටහැනිව කුමක් සඳහන් වුව ද සභාවේ යෝජනා සම්මුතියක් මගින් මෙම ව්‍යවස්ථාව සංශෝධනය කිරීම හෝ පරිච්ජින්න කොට අළුත් ව්‍යවස්ථාවක් සැකසීම හෝ අමතර අතුරු ව්‍යවස්ථාවක් සෑදීම කළ හැකි වන්නේ ය.

18. අර්ථ නිරූපණය :

"සභාව" යන්නෙන් පානදුර නගර සභාවද ;
"සභාපති" යන්නෙන් පානදුර නගර සභාවේ සභාපතිවරයාද;
"සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ බලයලත් නිලධාරියකු" යන්නෙන්, සභාපතිවරයා විසින් බලය පවරනු ලබන නගර සභාවේ යම් නිලධාරියකු ද;
"සභාපති විසින් තත් කාර්යය සඳහා බලය පවරනු ලැබූ බලයලත් නිලධාරියකු" යන්නෙන් සභාපතිවරයා විසින් ලිඛිතව බලය පවරනු ලැබූ නගර සභාවේ ස්ථිර තනතුරක් දරන නිලධාරියෙකු ද ;
"බල ප්‍රදේශය" යන්නෙන් 255 වන අධිකාරිය වන 1939 අංක 61 දරන නගර සභා ආඥා පනතේ 2 වැනි වගන්තිය යටතේ සංස්ථාපනය කර, 1978 අගෝස්තු 10 වන දින පළාත් පාලන නිවාස ඉදිකිරීම් අමාත්‍යවරයා විසින් රජයේ ගැසට් පත්‍රයේ පළකරන ලද පානදුර නගර සභාවේ බල ප්‍රදේශය ද;
"ත්‍රිරෝද රථය" යන්නෙන්, කුලී ගමන් අපේක්ෂාවෙන් නවතා තබා ගන්නා වූ ත්‍රිරෝද රථයක් ද;
"කුලී රියදුරෙකු" යන්නෙන්, ත්‍රිරෝද රථය පදවන අයිතිකරු හෝ එම රථය පැදවීම සඳහා අයිතිකරු විසින් යොදවා ඇති අයද ;
"නැවතුම් පොළ" යන්නෙන්, පානදුර නගර සභාව විසින් යෝජනා සම්මුතියක් මගින් නිශ්චය කරනු ලැබූ ත්‍රිරෝද රථ නැවතුම්පළ ද ;
"නියමිත නැවතුම්පොළ" යන්නෙන් පානදුර නගර සභාවේ සභාපතිවරයා විසින් බලපත්‍රයක් නිකුත් කරන ලද යම් නිශ්චිත නැවතුම්පළක් ද,
"මාසිකව" යන්නෙන්, එක් එක් මාසය ආරම්භයේ පළමු වෙනිදා සිට ඒ ඒ මාසයට අදාළ දින 28 හෝ දින 30 හෝ දින 31 කින් සමන්විත වූ මාසයකින් ;
"ත්‍රෛමාසිකව" යන්නෙන් මාසිකව යන අර්ථකථනය මගින් දී ඇති දින ගණන ඇති ජනවාරි 01 වනදායින් ආරම්භව අනුයාත මාස 03 බැගින් දෙසැම්බර් 31 වනදා දක්වා ද ;
"වාර්ෂික" යන්නෙන්, වර්ෂයක ජනවාරි 01 වැනිදායින් ආරම්භව දෙසැම්බර් 31 වැනිදායින් අවසන් වන ලිත් වර්ෂයක් ද ;

"පොලිස් නිලධාරියකු" යන්නෙන්, 53 වැනි අධිකාරිය වන 1865 අංක 16 දරන පොලිස් ආඥා පනතේ 104 වන වගන්තිය මගින් දී ඇති අර්ථකථනයම ද ;

"වෙනත් වාහන" යන්නෙන්, මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයම ද ;

"ලියාපදිංචි හිමිකරු" යන්නෙන්, මෝටර් වාහන ආඥාපනත මගින් ඊට දී ඇති අර්ථකථනයම ද ;

"පීඩාකාරී ක්‍රියාව" යන්නෙන්, පීඩා ආඥා පනත මගින් ඊට දී ඇති අර්ථකථනයම ද අදහස් වේ.

19. මේ අතුරු ව්‍යවස්ථා සිංහල හා දෙමළ භාෂා පාඨ සම්බන්ධව යම් අනනුකූලතාවයක් ඇති වුවහොත්, එවිට සිංහල භාෂා පාඨය බල පැවැත්විය යුතු ය.

*පළමුවන උපලේඛනය*

*3.3 අතුරු ව්‍යවස්ථාව*

පත් කරනු ලබන මාර්ග කමිටුව පහත සඳහන් සාමාජිකයන්ගෙන් සමන්විත විය යුතු ය :–

1. කමිටුවේ සභාපතිවරයා නගර සභාවේ සභාපතිවරයා විය යුතු අතර, ලේකම් සභාවේ ආදායම් පරීක්ෂකවරයා විය යුතු ය ;
2. නගර සභාවේ ලේකම් සහ කාර්මික නිලධාරි ;
3. මාර්ග සංවර්ධන අධිකාරියේ විධායක ඉංජිනේරු හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු ;
4. පළාත්බද මාර්ග සංවර්ධන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු ;
5. කළුතර මාර්ගස්ථ මගී ප්‍රවාහන අධිකාරියේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයකු ;
6. ලංකා ගමනාගමන මණ්ඩලයේ සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලබන නියෝජිතයෙකු ;
7. සභා බල ප්‍රදේශයට අයත් පොලිස් ස්ථානයන්හි රථ වාහන පොලිසියේ ස්ථානාධිපතිවරුන් හෝ ඔවුන් විසින් නම් කරනු ලබන නියෝජිතයකු බැගින් ;
8. සභාබල ප්‍රදේශය තුළ ඇති ලියාපදිංචි ත්‍රීරෝද රථ සංගම්වල නියෝජිතයකු බැගින්.

*දෙවන උපලේඛනය*

*4 වන අතුරු ව්‍යවස්ථාව*

ලදුපත් අංකයඃ- අංකය ඃ-
Receipt No. : No. :

**ත්‍රීරෝද රථ නැවතුම්පොළ බලපත්‍රය**

| | |
|---|---|
| නම | : |
| හැඳින්වීමේ අංකය | : |
| ගාස්තුව | : |
| නැවතුම්පොළ | : |
| වලංගු කාලය | : |
| දිනය | : |

සභාපති,
පානදුර නගර සභාව.

සෙ.මී. 13න් විශ්කම්භයක් සහිත වෘත්තයකි.
පසුබිම කහ (Yellow Colour) පැහැති වර්ණයෙන් යුක්ත ආකෘතියේ පරිදි කරුණු අඩංගු ස්ටිකරයකි.

**තුන්වන උපලේඛනය**

*6.2 අතුරු ව්‍යවස්ථාව*

***ත්‍රීරෝද රථ නැවතුම්පොළ බලපත්‍රයක් ලබා ගැනීම සඳහා අයදුම්පත්‍රය***

1. (i) අයදුම්කරුගේ නම : ——————,
(ii) ස්ථිර පදිංචි ලිපිනය : ——————,
(iii) වරිපනම් අංකය : ——————,
(iv) ස්ථිර පදිංචියට අදාළ පළාත් පාලන ආයතනය : ——————,
(v) ජාතික හැඳුනුම්පත් අංකය : ——————,

2. (i) ත්‍රීරෝද රථ ලියාපදිංචි අංකය : ——————,
(ii) පදවන්නා අයිතිකරු ද? නැතිනම් කුලී රියදුරු ද යන වග : ——————,
(i) අයිතිකරුනම් වලංගු රියදුරු බලපත් අංකය : ——————,
(2) කුලී රියදුරෙකු නම් : ——————,
(අ) රියදුරුගේ නම : ——————,
(ආ) ස්ථිර පදිංචි ලිපිනය : ——————,
(ඇ) ජාතික හැඳුනුම්පත් අංකය : ——————,
(ඈ) වලංගු රියදුරු බලපත් අංකය : ——————,

3. බලපත්‍රය ඉල්ලුම් කරනු ලබන ත්‍රීරෝද රථ නැවතුම්පොළ : ——————,

4. බලපත්‍රය ඉල්ලුම් කරන කාලය ඃ මසකට/මාස 03කට/අවුරුද්දකට : ——————,

ම විසින් ඉහත සඳහන් කර ඇති තොරතුරු නිවැරදි බවත්, යම් හෙයකින් එම තොරතුරු සාවද්‍ය බව තහවුරු වුවහොත්, මාගේ ත්‍රීරෝද රථ නැවතුම්පොළ බලපත්‍රය පූර්ව දැනුම් දීමකින් තොරව අවලංගු කිරීමට යටත් බවත්, නගර සභාව විසින් පනවා ඇති ත්‍රීරෝද රථ නැවැත්වීම පිළිබඳව අතුරු ව්‍යවස්ථාවේ සඳහන් විධිවිධානයන් පිළිපැදීමටත් එකඟ වෙමි.

දිනය ඃ..................................................... .................................................................,

අයදුම්කරුගේ අත්සන.

............................................................................. මහත්මා/මහත්මියට ..................................................................... අංක දරන ත්‍රීරෝද රථය........................................................... දරන නැවතුම්පොළෙහි නැවැත්වීම සඳහා බලපත්‍රය ........................................................ කාලයකට ලබාදීම අනුමත කරමි.

දිනය ඃ..................................................... .................................................................,

සභාපති,

පානදුර නගර සභාව.

11-923

ශ්‍රී ලංකා රජයේ මුද්‍රණ දෙපාර්තමේන්තුවේ මුද්‍රණය කරන ලදී.